**ශීර්ෂ 316 - වයඹ පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

## 1 දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සෞභාග්‍යමත් වයඹ ජනතාවක්

### 1.2 මෙහෙවර

වයඹ ජනතාවට වඩා උසස් ජීවන තත්ත්වයක් උදාකරදීම සඳහා කාර්යක්ෂම ඵලදායි ගුණාත්මක සේවාවක් සැලැසීමට ඇපකැප වීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කර ඇති දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයෙන් හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වයඹ පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.25,950,900,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.19,036,603,842 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.6,914,296,158 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26.64 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 21,943,000,000 | 16,413,000,000 | 5,530,000,000 | 25.20 |
| මූලධන | 4,007,900,000 | 2,623,603,842 | 1,384,296,158 | 34.54 |
| එකතුව | 25,950,900,000 | 19,036,603,842 | 6,914,296,158 | 26.64 |

මධ්‍යම රජය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.